# අපේ ආර්ථික විද්‍යාවක අවශ්‍යතාව

ඕනෑ ම දැනුම් පද්ධතියක් නිර්මාණය වන්නේ එය නිර්මාණය කරන සමාජ සංස්කෘතියට සාපේක්ෂව ය. සාමාජීය විද්‍යාවේ කොටසක් වන ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් ද බටහිරයන් නිර්මාණය කළ දැනුම ඔවුන් ජිවත් වන පරිසරයට, සංස්කෘතියට, ආගමට සාපේක්ෂ වේ.

අප බටහිර නිර්මාණය වු ආර්ථික විද්‍යාව අනුකාරක ලෙස භාවිත කිරීමේ දී මතු වන ගැටලුව හා අප ගේ ම වු ආර්ථික විද්‍යාවක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව මෙම ලිපියෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

බටහිර ආර්ථික විද්‍යාව මූලික ලෙස ම පදනම් වී ඇත්තේ පුද්ගලයා කේන්ද්‍ර කරගෙන ය. එහි දී පුද්ගල වුවමනාවන්ට සාපේක්ෂව හිග සම්පත් මිනිසා ගේ පරිභෝජනයට කෙසේ යෙදවිය යුතු ද යන්න අධ්‍යයනය කෙරේ. එනම් බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි සංස්කෘතියේ එන පරිදි මිනිසා ගේ ඉන්ද්‍රිය පිනවීම පදනම් කරගෙන සියලු සම්පත් මිනිසා ගේ පරිභෝජනය සඳහා මවා ඇත යන පදනමේ සිට මෙම දැනුම් නිර්මාණය වී ඇත.

අතීතයේ ස්වයංපෝෂිත ආර්ථිකයක් තුළ අන්‍යොන්‍ය සහජීවනය මූලික කරගනිමින් අභීත ජාතියක් ලෙස ජීවත් වු අපට අද ඇමෙරිකන් හා වෙනත් බටහිර ජාතීන් සපයන ණය මත යැපෙමින් ඔවුන් ගේ සම්බාධක හා තීරණවලට හිස නැවීමට සිදු වී ඇත්තේ අප සමාජ සංස්කෘතියට ගැලපෙන ආර්ථික විද්‍යාවක් නිර්මාණය කිරීමට අපොහොසත් වීම නිසා ය.

මෙසේ අනුකාරක ලෙස දැනුම ලබාගැනීමේ දී මතු වන ප්‍රශ්නය නම්, අප සංස්කෘතිය තුළ අපට හුරුපුරුදු වු ආකාරයෙන් ආර්ථික කටයුතු කිරීමත්, එහෙත් තීරණ ගැනීම සඳහා පදනම් වු න්‍යායනුත් අතර ඇති පරස්පරතාවයි. මේ නිසා අප සමාජය තුළ අනාගතයේ මතු විය හැකි ගැටලු හා ඒවාට අප සමාජ සංස්කෘතියට ගැලපෙන ආකාරයේ පිළිතුරු සෙවීමට අප අපොහොසත් වී ඇත. ඒ නිසා දැනට මුහුණ දෙන ආර්ථික ගැටලු හා අනාගතයේ මතු විය හැකි ගැටලු සඳහා පිළිතුරු සෙවීමට නැවත අපට බටහිරයන් ගේ උපදෙස් පැතීමට සිදු වී ඇත.

අතීතයේ අපට රැකියා වියුක්තිය, ආදායම් ව්‍යාප්තියේ විෂමතා, චිරස්ථායි සංවර්ධනය, අයවැය හිගය, එම හිගය පියවීමට විදෙස් ණය ලබාගැනීම ආදී සංකීර්ණ ප්‍රශ්න නො තිබිණි.

සිංහල බෞද්ධ සංස්කෘතියක තනි පුද්ගලයා ඉස්මතු වීම වෙනුවට ජාතියක් ලෙස සාමුහික ව ගොඩනැගීම මූලික විය. මේ බව අප වී ගොවිතැන් කළ ආකාරයත්, වැව් ගොඩනැගීම කළ ආකාරයත් අධ්‍යයනය කිරීමෙන් වටහා ගත හැකි ය. එහි දී බටහිර ආර්ථික විද්‍යාවේ එන පරිදි වැටුපට ශ්‍රමය සැපයීමක් සිදු නො විණි. වැටුම ගැන ම පමණක් සිතමින් කටයුතු කළා නම් ස්වයංපෝෂිත ආර්ථිකයක් තුළ වී අපනයනය කිරීමට හෝ අප අදටත් ප්‍රයෝජනයට ගන්නා මහා වාරි පද්ධතිය නිර්මාණය කිරීමට හෝ නොහැකි වනු ඇත. එහෙත් බටහිර ආර්ථික විද්‍යාව පසුපස යෑමෙන් අද අපට අඩු ම තරමින් අප ගේ මූලික ආහාර අවශ්‍යතාව වත් සපුරා ගැනීමට නොහැකි වී ලෝක වෙළෙඳපොළේ තීරණවලට හිස නවමින් කටයුතු කිරීමට සිදු වී ඇත.

බටහිර ආර්ථික විද්‍යාව අනුකාරක ලෙස පිළිගනිමින් සාපේක්ෂ වාසි න්‍යායට අනුව කුඹුරු ගොඩ කරමින් වී වගාව අත්හැර ඒ වෙනුවට බටහිරයන් අප මත බලෙන් පටවන සාපේක්ෂ වඩා ලාභදායි යැයි කියවෙන වෙනත් බෝග වගා කිරීමට ලැබෙන උපදෙස් පිළිගැනීමට සිදු වී තිබේ. පසුව බටහිරයන් ම තීරණය කරන කොන්දේසි, මිලට යටත් ව සහල් ආනයනය කිරීමට සිදු වී ඇත. අඩු ම තරමින් අපට සාපේක්ෂව ලාභදායී යැයි පැවසෙන භාණ්ඩ නිපදවන ප්‍රමාණය, එහි සැපයුම, මිල තීරණය කිරීමට වත් හැකියාවක් නැත. මූල්‍යමය සාධක මත පමණක් පදනම් වී ආර්ථික තීරණ ගනු වෙනුවට, අපෙ ගේ ස්වාධීනබව රැකෙන, වෙනත් සමාජ ප්‍රශ්න ඇති නො වන ආකාරයෙන් ආර්ථික කටයුතු මෙහෙයවා ගැනීමට හැකි වන දැනුමක් අප නිර්මාණය කරගත යුතු ව ඇත.

බටහිර ආර්ථික විද්‍යාව බිහි වූ පදනම පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී දිය හැකි හොඳ ම උදාහරණයක් නම් ඇඩම් ස්මිත් විසින් කරන ලද "ජාතීන් ගේ ධනය" (Wealth of Nations) යන කෘතියේ එන "අදිසි හස්තය" යන සංකල්පයයි. ඔහුට අනුව වෙළෙඳපොළ බලවේග ක්‍රියා කරන අදිසි හස්තයක් ඇති අතර ඒ අනුව ඉල්ලුම සැපයුම තීරණය වේ. එහෙත් බටහිර විද්වතකු වන Ludwig von Mises පසුව සඳහන් කළ පරිදි මෙම සංකල්පය සඳහා ඇඩම් ස්මිත්ට බලපා ඇත්තේ දෙවියන් පිළිබඳ සංකල්පයයි. බටහිරයන්ට අනුව සියලු දෙනාට ම ඉහළින් ඔවුන් මෙහෙයවන බලවේගය වන දෙවියන් සිටින අතර සියලු දේ සිදු වන්නේ දෙවියන් වහන්සේ ගේ කැමැත්ත මත ය. දැනුම නිර්මාණය කිරීමේ දී ද මෙම ආගමික පසුබිමෙන් ඇති වන බලපෑමෙන් ඔවුන්ට නිදහස් විය නොහැකි ය.

බටහිරයන්ට අනුව දියුණු වෙමින් පවතින රටක් යැයි සම්මත අපට ආර්ථික වර්ධනය වේගවත් කිරීමට හිඟ අයවැය පිළියෙල කිරීමට ලැබෙන උපදෙස් පිළිගනිමින් ක්‍රියා කර විදෙස් ණය මත ගෙවන පොළිය ගෙවීමට නැවත ණය ලබාගැනීමට සිදුවීම අප මුහුණ පා සිටින අර්බුදය මැනවින් පෙන්නුම් කරයි. අනෙක් අතට බටහිරයන් ගේ නිර්නායක මත පමණක් රටක දියුණු මැනිය හැකි ද? දියුණු වන රටක කෘෂිකාර්මික අංශයේ දායකත්වය ක්‍රමයෙන් අඩු වී සේවා කර්මාන්ත අංශවල දායකත්වය වැඩි වීම යන සංකල්පය අප වැනි කෘෂිකාර්මික රටකට කෙතරම් දුරට වලංගු වේ ද?

මූල්‍ය දියුණුව මිනිසා ගේ හර පද්ධතීන් විනාශ කර ගනිමින් ළඟා කර ගැනීමේ විපාක අද ඇති වී තිබෙන ලෝක ආර්ථික අර්බුදය විශ්ලේෂණය කිරීමෙන් හොඳින් වටහා ගත හැකි ය. මිනිසා ගේ ප්‍රයෝජනය සඳහා සම්පත් මවා ඇතැයි සිතමින් ආත්මාර්ථකාමී පරිභෝජන රටාවෙන් මිදීමට බටහිරයන් ගේ උපදෙස් පැතීම වෙනුවට අප ගේ ම වූ ආර්ථික ක්‍රමයක් නිර්මාණය කළ යුතු ය.

අප අප ගේ ම වූ ආර්ථික විද්‍යාවක් නිර්මාණය කර ගැනීමට අපොහොසත් වන තාක් බටහිරයන් අපට ඇති කළ ප්‍රශ්න විසඳා ගැනීමට බටහිරයන් සේ ම උපදෙස් හා පිළිතුරු ලැබෙන තුරු මුව අයා සිටීමට සිදු වනු ඇත.

*ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ*
*කළමනාකරණ විද්‍යා පීඨයේ කථිකාචාර්ය*
**ගයාත්‍රී ගුණතිලක**